السنهالية
١٦٥

# ලාඉලාහ ඉල්ලල්ලාහ්

## (අර්ථ විවරණය)

# معنى لا إله إلا الله

تأليف
عبد الكريم الديوان



The Cooperative Office For Call & Guidance to Communities at Rawdhah Area
Under the Supervision of Ministry of Islamic Affairs and Endowment
and Call and Guidance -Riyadh - Rawdhah
Tel. 4922422 - fax.4970561 E.mail: mrawdhah@hotmail.com P.O.Box 87299 Riyadh 11642

# ලාඉලාහ ඉල්ලල්ලාහ්

## (අර්ථ විවරණය)

# معنى لا إله إلا الله

تأليف/ عبد الكريم الديوان

ⓒ المكتب التعاوني للدعوة والإرشاد بالروضة، ١٤١٨هـ

*فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر*

الدويان، عبدالكريم

معنى لا إله إلا الله .- الرياض.

٢٠ ص ؛ ١٢×١٧ سم

ردمك : ٠ - ٩١٢٠ - ٦ - x - ٩٩٦٠

( النص باللغة السنهالية)

١- الشهادة (أركان الإسلام) ٢- العقيدة الإسلامية

٣- الإيمان (الإسلام) أ- العنوان

ديوي ٢٤٠ ١٨/٢٦٩٥

رقم الإيداع : ١٦/٢٦٩٥

ردمك : ٩٩٦٠ - ٩١٢٠ - ٦ - x

# ලාඉලාහ ඉල්ලල්ලාහ්

(අර්ථ විවරණය)

කතෘ

අබ්දුල් කරීම් අල් දීවාන්

සිංහලෙන්

අබූ ෂාඉරා මුහම්මදු හුසෙයින්

بسم الله الرحمن الرحيم

بسم الله الرحمن الرحيم

إن الحمد لله تعالى نحمده، ونستعينه،ونستغفره،ونعوذبالله من شرور أ نفسنا، ومن سيئات أعمالنا.،من يهده الله فلا مضل له ومن يضلل فلا هادى له،وأشهد ان لااله الاالله وحده لا شريك له ، وأشهد ان محمدا عبده ورسوله، صلى ا لله عليه وسلم.

මහා කාරුණික අති දයාන්විත අල්ලාහ්ගේ නාමයෙන් ආරම්භ කරමි.

නිශ්චය වශයෙන්ම සියළුම පැසසුම් හිමිවන්නේ අල්ලාහ් ටය.ඔහු ප්‍රශංසා කර ඔහුගෙන්ම සහාය පතන අතර ඔහු ගෙන්ම පව් සමාව අයදිමු.ඉතා ශ්‍රේෂ්ඨ වූ අල්ලාහ් වෙතින්, පව් හා නින්දිත ක්‍රියාවන් හට ලක් නොවීමට ද ආරක්ෂා පතමු. අල්ලාහ් පෙන්වන යහමග කවරෙකු හට ලැබෙන් නේද, එම තැනැත්තා නොමග යැවීමට කිසිවෙකුට කළ නොහැකිය. එමෙන්ම අල්ලාහ්ගේ යහමග කවරෙකුට නොලැබෙන්නේද, එම තැනැත්තා යහමගට ගෙන ඒමට කිසිවෙකුට කළ නොහැක. නමද, නැමදීමට සුදුසු එකම දෙවියා අල්ලාහ් බව මම ශාක්ෂි දරමි.මුහම්මද් (සල්) තුමා අල්ලාහ් ගේ දාසයා හා වක්තෘවරයා බවද මම සාක්ෂි දරමි. ඔහු කෙරෙහි අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය උදාවේවා!

<u>ලාඉලාහ ඉල්ලල්ලාහ්</u>

ඉස්ලාම් ආගමේ මූලික ප්‍රතිපත්තිය වූත් අල්ලාහ් තම අත වැසියන් හට අණ කළ ඉතා වැදගත් වූත් **ලා ඉලාහ ඉල්ලල්ලාහ් මුහම්මදුර් රසූලුල්ලාහ්** (වැඳීමට සුදුසු වූ සත්‍ය දෙවියා අල්ලාහ් හැර අන් කෙනෙකු නැත, මුහම්මද් නබි (සල්) තුමා අල්ලාහ්ගේ වකතෘ වරයාද වේ.) යන වචනය විශ්වාසය තහවුරුවීමේ පදනම මත පවතී යන්නෙහිත්,මෙය ප්‍රකාශ කිරීමෙන් කෙනෙකු මුස්ලිමෙකු වන අතර පරම සතුරා මිතුරෙකු ලෙසද,සියලු සම්පත් උදුරා ලේ සිඳිය යුතු කෙනෙකු එයින් ආරක්ෂාවූ අයෙකු ලෙසද පත්වේ යන්නෙහිත් ආගමික විද්වතුන්ගේ ඒකමතික තීරණය වේ.

ඉහත සඳහන්වූ ෂහාදා වචනය ප්‍රකාෂ කර සාක්ෂි දැරීමෙන් තොරව මුස්ලිම් නොවූ කෙනෙකු මුස්ලිම්වූ බව කීමට, නො හැකිය.මක් නිසාද යත්,ෂහාදා නම් ඉහත සඳහන් ප්‍රකාශනය ඉස්ලාම් ආගමේ යතුර සහ එහි මූලික ප්‍රතිපත්තීන් අතර ප්‍රධානතම කුළුණ ද වන බැවිනි.

මතු සඳහන් හදීසය එය තහවුරු කරයි:
ඉස්ලාම් ආගම කුළුණු පහක් මත රඳා පවතී. (එහි මුල් කුළුණ) ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් සාක්ෂි දැරීම වේ.

<u>මෙය ප්‍රකාශ කිරීමට වරම් ලද ද එසේ ප්‍රකාශ නොකළ කෙනෙකුගේ ඉරණම:</u>

ඉස්ලාමීය ආගමික විද්වතෙකු වන ඉමාම් ඉබ්නු තෛමියා මෙසේ පවසයි: කෙනෙකු ලාඉලාහ ඉල්ලල්ලාහ් මුහම්මදුර් රසූලුල්ලාහ් යන මෙම වචනය ප්‍රකාශ කිරීමට වරම්

ලද ද, එසේ ප්‍රකාශ නොකර ප්‍රතික්ෂේප කිරීමෙන් මහු කාෆිර්(අල්ලාහ් ප්‍රතික්ෂේප කළ මුස්ලිම් නොවූ කෙනෙකු) වන බව ඉස්ලාමීය විද්වතුන්ගේ නිගමණය වේ. පංචේන්ද්‍රියයන්හී ඇති වූ ඌනතාවයක් නිසා හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතූන් නිසා හෝ එය ප්‍රකාශ කිරීමට නොහැකි වූවහොත් හෙතෙම මුස්ලිම් අයෙකුගේ ස්වභාවය අනුව තීන්දු වේ.

<u>ලාඉලාහ ඉල්ලල්ලාහ් යන්නෙහි තේරුම කුමක්ද?</u>

මෙම වචනය ප්‍රතික්ෂේප කිරීම සහ ස්ථිර කිරීම යනුවෙන් දෙකොටසකට බෙදේ.

ප්‍රතික්ෂේප කිරීම: "ලා ඉලාහ්" යන්න දෙවියෙකු නැත යනුවෙන්ද, ඉලාහ් යන වචනය වැඳීමට සුදුසු දෙවියා යන තේරුම වේ.

ස්ථිර කිරීම: "ඉල්ලල්ලාහ්" එනම් වැඳීමට සුදුසු සත්‍යවන්ත දෙවියා අල්ලාහ් හැර අන් කෙනෙකු නැත යනුවෙන් හෝ වැඳීමට අල්ලාහ් හැර වෙනත් සුදුස්සෙකු නැත යනු වෙන් හෝ තේරුම වේ.

ධර්මාවබෝධයෙන් හීන වූ සමහර අය මෙම වචනයේ ඉලක්කය එය කට වචනයෙන් කීම පමණකි, නො එසේ නම් අල්ලාහ් යනුවෙන් කෙනෙකු ඇති බව භාරගැනීම, නො එසේ නම් සියල්ලෙහි අයිතිකරුවා අල්ලාහ් වේ එහි කිසිවෙකු හට කිසිඳු අයිතියක් නැති බව පිළිගැනීම යනුවෙන්ද අදහස් දරති. මෙම අස්ථිර අදහස පිළිම් වන්දනාකරුවන් පවා අවබෝධ කර ගෙන පිළිගතිති. මොවුන්ගේ

අදහස පිළිගැනීමට හැකි නම් මොවුන් මෙම වචනය (තව්හීද්) වෙත කැඳවීමට අවශ්‍යතාවයක් නැත.

<u>මෙහි තේරුම කෙරෙහි මතුවන ප්‍රශ්න:</u>

ප්‍රශ්නය: අල්ලාහ් හැර වැඳීමට වෙනත් දෙවිවරු නැති බව කියන්නේ කෙසේ ද? අල්ලාහ් හැර වෙනත් දෙවිවරු මහජනයන් විසින් වැඳුව පිදුම් කරනවා නොවෙද? එමෙන් ම අල්කුර්ආනයේ ආලිහා (දෙවියන්) යනුවෙන් බහු පදාර්ථයෙන් වචනයන් සඳහන් වෙනවා නොවෙ ද?

ඔබ දෙවියාගෙන් (ඔවුන් විනාශ කිරීම පිණිස) අණවූකළ අල්ලාහ් හැර ඔවුන් (උදවු ඉල්ලා ඇමතූ දෙවියන්) ගෙන් කිසිදු පිළිසරණයක් නො විය. (අල්-කුර්ආන් 11 : 101)

උත්තරය:අල්ලාහ් හැර ඔවුන් ඇමතූ සියළු දෙවියන් ව්‍යාජ ඒවා වන අතර, ඒවා සත්‍ය දෙවිවරු ද නොව. වැඳීමට සුදුසු යයි කියනා එම දෙවිවරු කෙරෙහි කිසිදු දිව්‍යමය භාවයක් හෝ නැත. සැබැවින්ම අල්ලාහ් සත්‍ය (දෙවියා) වෙ. ඔවුන් අල්ලාහ් හැර අමතන අන් සියළු දෙවියන් නිසැකයෙන්ම ව්‍යාජ ඒවා වෙ. අල්ලාහ් මහු අති ශ්‍රේෂ්ඨ හා අති උසස්වෙ. (අල්-කුර්ආන් 22 : 62 )

එසේ හෙයින් "ලාඉලාහ ඉල්ලල්ලාහ්" යන වචනයෙහි තේරුම වැඳීමට සුදුසු යෝග්‍ය දෙවියා අල්ලාහ් හැර අන්-කිසිවෙකු නොව යන්න වෙ. නිසැකයෙන්ම මෙය ඒකදේව වාදය (තව්හීද්) වෙ. මෙම ෂහාදා වචනය මගින් කෙනෙකු

ගේ ක්‍රියාවන් අනුමත වන අතර පිළිගැනීමට ද සුදුසු ඒවා බවට පත් වේ.

කෙනෙකුගේ ක්‍රියාවන් අනුමත වන්නේ "ලාඉලාහ ඉල්-ලල්ලාහ්" යන වචනයෙහි අඩංගු තව්හීද් පදනම මත පමණි. මෙම තව්හීද් (විශ්වාසයෙන්) තොරව කෙනෙකු ගේ කිසිදු ක්‍රියාවන් ඔහු හට කිසිදු ප්‍රතිලාභයක් ගෙන නො දේ. එවැනි ක්‍රියාවන් මගින් එලොව සහ මෙලොව දෙකෙහිම ඔහු හට කිසිදු ප්‍රයෝජනයක් නො ලැබේ. මෙයට හේතුව වන්නේ ඒකදේව වාදයට හාත්පසින්ම විරුද්ධ "ෂිර්ක්" එනම් අල්ලාහ් ප්‍රතික්ෂේප කර ආදේශ කිරීම මත කෙරෙනා කිසිදු පුන්‍ය කර්මයක් හට කිසිදු ප්‍රතිලාභයක් ගෙන නොදෙන නිසාය.

මේ සම්බන්ධයෙන් අල්කුර්ආනය මෙසේ පවසයි:

තමා, අල්ලාහ් (ගේ ඒකීය භාවය) ප්‍රතික්ෂේප කරනා බව තමන් විසින්ම සාක්ෂි දරනා මොවුන්, අල්ලාහ් ගේ දේවස්ථාන (මස්ජිද්) පරිපාලනය කිරීම සඳහා කිසිදු අයිතියක් (මොවුන්හට) නැත. මොවුන්ගේ සියලු ක්‍රියාවන් ද විනාශ වී ගොස් ඇත. තවද මොවුන් සදහටම නිරයේ පසුවනු ඇත. (අල්කුර්ආන් 9 : 17 )

කෙනෙකු "ලාඉලාහ ඉල්ලල්ලාහ්" යනුවෙන් කට වචන-යෙන් කීම පමණක් සෑහේ. ඉන් පසු කුමණ ක්‍රියාවක් කළද එයින් කිසිදු හානියක් සිදු නොවේ යන්න සමහර අයගේ අදහස වේ. ඇත්තෙන්ම මෙය වැරැදි නිගමනයකි. එමෙන්ම මහා අණුවන ක්‍රියාවකි.

ඉතා ශ්‍රේෂ්ඨ මෙම වචනය ප්‍රකාශ කිරීමෙන් පමණක් නොසෑහේ. එය ඉතා වැදගත් කරුණු රාශියකින් අන්තර්-ගතවූ ගැඹුරු තේරුම් ඇති වචනයකි. එම නිසා මෙම වචනය ප්‍රකාශ කළ කෙනෙකු එය වටහා එහිවූ තේරුම් එදිනෙදා ක්‍රියාවන් මගින් හෙළි කිරීමට බැඳී සිටී.

කෙනෙකු මහුගේ ජේසත සහ ජීවිතය යන දෙකෙහි ආරක්ෂා සඳහා අනුමතවූ නියම මුස්ලිමෙකු විය හැක්කේ, මෙම වචනය ප්‍රකාෂ කර, එය සිතෙහි ස්ථිරව තැන්පත් කර,ඒ අනුව තම ජීවිතයෙහි ක්‍රියා කර,එයට එරෙහි වූ සියලු නුසුදුසු ක්‍රියාවන්ගෙන් මිදීමෙන් සහ හෙළා දකී-මෙන් පමණි.

මෙම "ලාඉලාහ ඉල්ලල්ලාහ්" යන වචනයෙහි තේරුම පැහැදී ඒ අනුව ක්‍රියා නොකර කට වචනයෙන් පමණක් ප්‍රකාෂ කිරීමෙන් කිසිඳු ප්‍රයෝජනයක් නැති බව ඉස්ලාමී-ය විද්වතුන්ගේ ස්ථිර නිගමනය වේ.

<u>ලාඉලාහ ඉල්ලල්ලාහ් යන ප්‍රකාශය මතු සඳහන් කරුණු හයක් මත රඳා පවතී.</u>

1. වැඳීම වැනි සියලු කුසල් කර්‍මයන් අල්ලාහ් වෙනුවෙන් පමණක් ඉටු කිරීම.

කෙනෙකු කරනා සලාතය,උපවාසය,භාරවීම සහ කුසල් පිණිස සතුන් බිලිදීම වැනි සියලු අනුමත කුසල් ක්‍රියාවන් අල්ලාහ් වෙනුවෙන් පමණක් ඉටු කළ යුතුය. අනෙක් අතට මෙයින් යම්කිසි ක්‍රියාවක් අල්ලාහ් හැර වෙනත් කෙනෙකු උදෙසා ඉටු කරන්නේනම් ඔහු කුමණ තත්ත්ව-යක වුවද ලාඉලාහ ඉල්ලල්ලාහ් යන වචනය උල්ලංඝනය

කළ  කෙනෙකු ලෙස සැළකේ.එමෙන්ම ඔහු ඒකදේවවාද (තව්හීද්) යෙන් ඉවත්වූ කෙනෙකු ලෙස ද සැළකේ.

මේ සම්බන්ධයෙන් අල්කුර්ආනය මෙසේ පවසයි:
(නබි තුමනි) ඔබ  දෙවියා  තමා  හැර (අන් කිසිවෙකු) නො වඳිනා ලෙස අණ කර ඇත. (අල්කුර්ආන් 17:23)
ලාඉලාහ ඉල්ලල්ලාහ් යන්නෙහි නියම අර්ථය මෙය වේ.

කෙනෙකු  "ලාඉලාහ ඉල්ලල්ලාහ්" (වැඳීමට සුදුසු සත්‍ය දෙවියා  අල්ලාහ්  හැර අන්  කෙනෙකු නැත.) යනුවෙන් පවසන  අතර  අල්ලාහ්  හට ආදේශ කිරීමෙහි ද නියැළී සිටින්නේනම්,  හෙතෙම ඒකදේව වාදය (තව්හීද්)  කරා හැරෙනා  තුරු ඔහුට  එරෙහිව සටන්  වැදිය යුතු යන්න ඉස්ලාමීය විද්වතුන්ගේ නිගමනය වේ.

2. අල්ලාහ් සහ ඔහුගේ වක්තෘවරයා විසින් ප්‍රසිද්ධ කරන ලද සියලුදේ කෙරෙහි විශ්වාස කිරීම. දේව දූතයන්,ග්‍රන්ථ, වක්තෘවරු, පරමාන්ත  දිනය (යවමුල් කියාමා), ස්වර්ගය, නිරය සහ හොඳ සහ නරක සියල්ල  අල්ලාහ්ගේ  පෙර නියම මත සිදුවන බව අල්ලාහ් සහ ඔහුගේ වක්තෘවරයා විසින් අප හට දන්වන ලද බව විශ්වාස කිරීම.

3.අල්ලාහ්  වෙනුවෙන් හැර අන් කෙනෙකු උදෙසා සිදුවන සියලු වැඳුම් පිදුම් ප්‍රතික්ෂේප කිරීම.

මුහම්මද් නබි (සල්) තුමා මෙසේ කීවේය:
ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් ප්‍රකාශ කර අල්ලාහ් හැර අන් ඒවා වඳින්නන් ප්‍රතික්ෂේප කරන්නේ කවරෙක් ද,ඔහු-ගේ ප්‍රාණය සහ දේපල ආරක්ෂා වන්නේය.

කෙනෙකුගේ ප්‍රාණය සහ ඉස්සත ආරක්ෂාව පිණිස නබි (සල්)එය හේතූන් දෙකක් මත නිර්දේශ කෙළේය.

1. **ලාඉලාහ ඉල්ලල්ලාහ්** යන වචනය ප්‍රකාශ කිරීම.
2. අල්ලාහ් හැර වඳිනා සියල්ල ප්‍රතිකෙෂ්ප කිරීම.

සත්‍ය විශ්වාස වන්තයෙක් ආදේශ කරන්නන්ගෙන් වැළකී සිටිනා අතර ඔවුන් කරනා සියලු පූජ්‍ය කර්මයන්ද හෙළා දකී.

ඉබ්‍රාහීම් නබි තුමා විසින් පැවසූ බව අල්කුර්ආනයේ මෙසේ සඳහන් වේ.

සැබැවින්ම ඔබ වඳිනා දෙවිවරුන්ගෙන් මම ඉවත්වෙමි. නමුදු මාගේ නිර්මානාවරයා හැර ( අන් කිසිවෙකු මම නොවඳිමි). (අල්කුර්ආන් 43 : 26 )

එම නිසා තාඝූත් (ව්‍යාජ දෙවිවරු)ව ප්‍රතිකෙෂ්ප කර අල් ලාහ් පමණක් වඳින්නේ කවරෙක්ද ඔහු (නොගිලිහෙනා) සවිමත් ආධාරකයක් (අත්පත් කර) ගත්තෙක් වේ.
(අල්කුර්ආන් 2 : 256 )

ඉහත සඳහන් වන අල්කුර්ආන් වාක්‍යයන්හි සඳහන් වන "අල් උර්වතුල් වුස්කා"(සවිමත් ආධාරකය)යන වචනයෙන් පැහැදිලි කරන්නේ ඉස්ලාම් දහම ගැනවේ. එම ඉස්ලාම් දහමේ මූලික පදනම (තව්හීද්)ඒකීය වාදයවේ.එහි සඳහන් වන අනෙක් වචනය වන"යක්ෆුර් බිත්තාඝූත්" යන්නෙහි තේරුම ව්‍යාජ දෙවිවරු ඇදහීමෙන් ඈත්වීම යන්න වේ.

අත්තාඝූත් හී තේරුම: අල්ලාහ් හැර වඳිනා සියලු ව්‍යාජ යන් මෙයට ඇතුලත් වේ.නමුත් නබිවරුන් ,ධාර්මිකවරුන් සහ දේව දූතයන් වැනි සමහරුන් කෙරෙහි ඔවුන්ගේ

අකැමැත්ත මත අල්ලාහ්ට විරුද්ධ වැඳුම් පිදුම් කළද, ඒ අය වැනි සුද්ධවන්තයින් තෘසූත් සනයෙහිලා සැළකිය නො හැකිය. මෙවන් නොමග ගියවුන් ෂෙතාන් මගින් ඇති කරනා ව්‍යාකූලතාවය නිසා මනා අවබෝධයකින් තොරව අල්ලාහ් හැර අල්ලාහ් ගේ දැහැමි අනවැසියන් හා ධාර්මිකයන් වැඳුම් පිදුම් සඳහා තෝරා ගනිත.

4 ලාඉලාහ ඉල්ලල්ලාහ් වචනයේ පදනම මත අල්ලාහ්ට හා ඔහුගේ වක්තෘ වරයා හට අවනත වීම.

අල්කුර්ආනය මෙසේ පවසයි:

මවුන් පස්චාතාපවී (තවබා අයැද) සලාත් හී නිරත වී සකාත්ද ගෙවන්නේ නම් (මවුන්ගේ මාවතෙහි) මවුන් අත් හරින්න. (අල්කුර්ආන් 9 : 5 )

මුහම්මද් නබි (සල්) තුමා මෙසේ පැවසීය:

වැඳීමට සුදුස්සා අල්ලාහ් හැර අන් දෙවියෙකු නැත.තවද මුහම්මද් තුමා අල්ලාහ්ගේ වක්තෘ වරයා ද වේ යනුවෙන් ප්‍රකාශ කර සලාත්හී යෙදී සකාත්ද ගෙවන තුරු මවුන්ට එරෙහිව සටන් විදිනා ලෙස මා හට අණ කර ඇත. ඉස්-ලාම්හී අනෙකුත් අයිතිවාසිකම් කෙරෙහි (සීමාවන් නො-ඉක්මවා)ඒවා ඉටු කරන්නේනම් මහුගේ ප්‍රාණය හා දේප-ත වෙනුවෙන් මා වෙතින් ආරක්ෂාව ලැබේ . තවද මවුන්-ගේ තීරණාත්මක අවදිය අල්ලාහ් වෙත වේ. (බුහාරි සහ මුස්ලිම් ග්‍රන්ථ ඇසුරෙන්)

ඉහත සඳහන්වූ අල්කුර්ආන් 9 : 5 වාක්‍යයේ ෆඉන්තාබූ (කෂමාව අයැද) නම් වචනයේ තේරුම:මවුන් ෂිර්ක් එනම් ආදේශ කිරීමෙන් වැළකී අල්ලාහ් වෙතින් කෂමාව අයැද

ඒකදේවවාදය පිළිපැද සලාත් ඉටුකර සකාත්ද ගෙවන්නේ නම් මවුන්ගේ පාඩුවේ සිටීමට ඉඩ දෙන්න යනුවෙන් වේ.

ෂෙයිකුල් ඉස්ලාම් ඉබ්නු තෛමියා මෙසේ පවසයි: ඉතා විශ්වාසදායී ලෙස කට වචනයෙන් ෂහාදා ප්‍රකාශ කර බාහිරව පවතින ඉස්ලාමීය නීතිරීතින් පිළිපැදීම ප්‍රතිකෙෂ්ප කරන සියල්ලන් හට එරෙහිව සටන් වැදීම අනිවාර්යයවේ. ඒ අය ෂහාදා ප්‍රකාශ කර ෂරීඅත් (ඉස්ලාමීය නීතිරීති) හී සමහර දේවල් ඉටු කරනා අය වූවද, ඒවා ක්‍රමානුකූලව පිළිපදිනා තුරු මවුන්ට එරෙහිව සටන නොනැවැතී පැවතිය යුතුය.

හස්රත් අබූ බක්ර් (රලි)තුමා සහ අනෙකුත් සහාබාවරු සකාත් දීම ප්‍රතිකෙෂ්ප කළ අයට එරෙහිව දරුණු ලෙස සටන් වැදුහ.මවුන්ට පසු පැමිණි ආගමික විද්වතුන් පවා ඒ මතය අනුමත කළහ.

5. "ලාඉලාහ ඉල්ලල්ලාහ්" නම් විශ්වාස වගන්තිය මතු සඳහන්වූ කරුණු මගින් පරිපූර්ණ වේ.

1. අල් ඉල්ම්: ඥානය. මෙය අඥානය යන්නෙහි විරුද්ධ පදයවේ.ඥානය යනු ඉහත සඳහන්වූ වචනයේ තේරුම වන වඳින්නට සුදුසු දෙවියා අල්ලාහ් හැර අන් කෙනෙකු නොවන බව පැහැදිළිව දැන ගැනීම වේ.

2. අල්යකීන්: ස්ථිරතාවය. මෙය සැකයෙහි විරුද්ධාර්ථ පදය වේ.වැඳීමට සුදුස්සා අල්ලාහ් පමණක් යන්නෙහි ස්ථිරතාව යෙන් සිටීම.

3.අල් ඉක්ලාස්: පවිත්‍රතාවය. එනම් වැඳීමට සුදුස්සා අල්ලාහ්

පමණකි.සියලු වැඳුම් පිදුම් අයත්වන්නේ ඔහුට පමණි.එයට පටහැනිව යමෙකු කළේ නම් ඔහු මුෂ්රික්(ආදේශ කරන්නෙක්)වේ යන පවිත්‍ර චේතනාවෙන් ක්‍රියා කිරීම.

4.අස් සිද්ක් :සත්‍යතාවය. ලාඉලාහ ඉල්ලල්ලාහ් යන වචනය ප්‍රකාශ කරන්නා ඒ පොරොත්තුව මත ක්‍රියා කළ යුතු අතර ඔහුගේ වචනය හිත සමඟද හිත වචනය සමඟද සම්මිශ්‍රණය විය යුතුය. එය වචනයෙන් පමණක් ප්‍රකාශ කර, සිතෙහි තැන්පත් නොකර ක්‍රියා නොකිරීමෙන් කිසිදු ප්‍රයෝජනයක් නැති බව පිළිගැනීම.

5.අල් මහබ්බත් :ආදරය. මෙහි තේරුම කෙනෙකු අල්ලාහ් හා ඔහුගේ අණවලට කීකරුවීම කෙරෙහි හිතවත් භාවය දැක්වීම වේ. මෙම වචනය ප්‍රකාශ කර අල්ලාහ් සහ ඔහු ගේ අණවලට කීකරු වී හිතවත් භාවය නො දක්වන්නේ නම් ඔහු කාෆිර් වේ.

6.අල් ඉන්කියාද් : කීකරු වීම. අල්ලාහ්ට පමණක් වැඳීම සහ අල්ලාහ්ගේ අණවලට අවනත වී ඒවා විශ්වාස කර සම්පූර්ණ සත්‍ය බව පිළිගෙන කීකරුවීම. වෙනුවට කෙනෙකු මෙම අදහසට එරෙහිව ක්‍රියා කරන්නේ නම් ඔහු නොමුස්ලිමෙකු ලෙස පිළිගැනේ.

7.අල් කබූල් :පිළිගැනීම. එනම් ලාඉලාහ ඉල්ලල්ලාහ් යන වචනය, කෙනෙකුගෙන් බලාපොරොත්තු වන්නා වූ දෙය සම්පූර්ණයෙන්ම පිළිගෙන ක්‍රියා කිරීම.

8. ෂහාදා(ලාඉලාහ ඉල්ලල්ලාහ්) වචනය කඩ කරනා කාර්‍ය-යෙන් වැළකී සිටීම කෙනෙකුගේ ෂහාදාව සම්පූර්ණකරයි.

**ෂහාදා වචනය නිෂ්පල කරනා සමහර කරුණු**

1.කෙනෙකු අල්ලාහ් හා තමා අතර අතරමැදියෙකු පත්කර අල්ලාහ්ට පවසන ලෙස ඉල්ලා මවුන්ගේ අනුග්‍රහය අයැද සිටීමෙන් අල්ලාහ්ට ෂිර්ක් කළ කෙනෙකු ලෙස පත්වෙ යන්න ආගමික විද්වතුන්ගේ නිගමය වෙ.

2. අල්ලාහ්ට ආදේශ කරන්නන් අල්ලාහ් ප්‍රතික්ෂේප කරන් නන් ලෙස නොසළකා සිටීම හෝ මවුන් ආදේශ කරන්-නන් ලෙස සැක නොසිතා මවුන්ගේ ක්‍රියාවන් අනුමත කිරීමෙන් කෙනෙකු කාෆිර් බවට පත්වේ.

3. මුහම්මද් නබි (සල්) තුමාගේ ආදශ්මත් මග පෙන්වීමට වඩා වෙනත් කෙනෙකුගේ ආදශ්ය සම්පූර්ණවූ එකක් යයි විශ්වාස කිරීම. මුහම්මද් නබි (සල්) තුමාගේ තීරණ යට වඩා වෙනත් කෙනෙකුගේ තීරණය අගය කිරීම හෝ අනෙකුත් ව්‍යාජ දෙවිවරුන්ගෙන් ආවෙ යයි පවසන දේ අගය කොට සැළකීම සහ ඒවා පිළිපැදීම.

4.මුහම්මද් නබි (සල්) තුමා ප්‍රචලිත කළ මාග්ය තමා පිළිගත්තා අතර එයින් යමක් හෝ පිළිකුල් කිරීමෙන්ද හෙතෙම කාෆිර් බවට පත් වෙ.

5. මුහම්මද් නබි (සල්) තුමා දේශනා කළ සත්‍ය ආගමෙ යමක් විහිළුවක්සේ සළකා විවේචනය කරන්නේ නම් හෝ ඉස්ලාම් පවසන්නා වූ අඩුවම් සහ ප්‍රසාද වැනිදේ නුවුවමනා ලෙස විවේචනය කළ ද මහු කාෆිර් වී මහු ප්‍රකාශ කළ ෂහාදා වචනයද මහු හට කිසිදු ප්‍රතිලාභයක් ගෙන නො දේ.

6.ආදේශ කරන්නන් හා එකතුවී මුස්ලිම් අය හට විරුද්ධව කැරලි ගැසීම,සතුරන් හට සහයෝගය දැක්වීම සහ ඔවුන්ට පක්ෂපාත වීම.

7. මුහම්මද් නබි (සල්) තුමා ඉදිරිපත් කළ ෂරීඅත් (ඉස්ලාමීය නීති මාලාවන්) වෙතින් ඉවත්වීමට සමහරුන්ට වරප්‍රසාද ඇත යනුවෙන් නිගමනය කිරීම.

8. අල්ලාහ් පෙන්වා දුන් මග වන ඉස්ලාමීය ආගම ප්‍රතික්ෂේප කිරීම එවා අධ්‍යනය නොකිරීම සහ එවා නොපිළිපැදීම.

9. ඉස්ලාම් ආගම පෙන්වා දී ඇති සත්‍ය කරුණු වලින් යමක් හෝ අසත්‍ය බව නිගමණය කිරීම.

10. අල්ලාහ් සහ මුහම්මද් නබි(සල්)තුමා වැළැක්වූ දෙයින් යමක් හෝ හලාල් (සුදුසුයි-අනුමතයි ) යනුවෙන් පිළිගැනීම. (උදාහරණයක් වශයෙන් :පොලිය සහ මද්‍යවග්)

<u>ලාඉලාහ ඉල්ලල්ලාහ් නම් වචනය ප්‍රකාෂ කළ තැනැත්තා ස්වර්ගයට පිවිසේ යන හදීසයේ තේරුම:</u>

1.ලාඉලාහ ඉල්ලල්ලාහ් නම් වචනය ප්‍රකාශ කර ඒ හා සොතෙකු මරණයට පත්වන්නේ නම් ඔහු ස්වර්ගයට පිවිසේ. (බුහාරි සහ මුස්ලිම් ග්‍රන්ථ අසුරෙන්)

2.වැඳීමට සුදුස්සා අල්ලාහ් හැර අන් කෙනෙකු නොවේ. නවද මුහම්මද් තුමා අල්ලාහ් ගේ දාසයෙකු සහ අවසාන වක්තෘ වරයාදවේ යනුවෙන් ශාක්ෂි දරන්නේ කවරෙක් ද,

අල්ලාහ් ඔහු හට නිරයේ ගින්න හරාම් ( තහනම්) කරන්නේය. (මුස්ලිම් ග්‍රන්ථය අසුරෙන්)

මේ හදීස් දෙක සහ මේ හා සම්බන්ධ අනෙකුත් හදීස් වලට අදහස් දක්වන්නේ කෙසේද?

මේ හදීස් ගැන සළකා බලද්දී, මෙම වචනය කටෙන් ආමන්ත්‍රනය කළ කෙනෙකු ස්වර්ගයට පිවිසෙන අතරම නිරයේ ගින්නෙන් ද ගැලවීම් ලැබෙන බව සනාථ වෙ යනුවෙන් ඉමාම් ඉබ්නු තෛමියා(රහ්) ගේ විග්‍රහය ඉතා පැහැදිළිව ඇත.

ඉමාම් ඉබ්නු තෛමියා(රහ්) ගේ විග්‍රහය:

මෙම වචනය හෘදයානුකූලව ආමන්ත්‍රනය කර එලෙසින්ම මරණයට පත්වන්නන් ගැන මෙම හදීසය කරුණු පහදයි. එමෙන්ම ඉතා පිරිසිදු සිතින් සම්පූර්ණයෙන්, නිසැකව විශ්වාස කර, ස්ථිරතාවයෙන් මෙම වචනයේ තේමාව මස්සේ තම ජිවිතය සකස්කර ගැනීමට තීරණය කර ආමන්ත්‍රණය කරන්නන් ගැන පමණක් මෙම හදීසට විග්‍රහ කරන බව ඔහුගේ තීරණය වේ.

තව්හීද් හී යතාර්ථය, කෙනෙකු මුළු හදින් ඒ කෙරෙහි ඇදී යෑම වේ. හෙතෙම ඔහුගේ සියලූ පෙර පාපකර්මයන් ගෙන් ඉවත්වී ඉතා පිරිසිදු සිතෙන් අල්ලාහ් වෙතින් සමාව අයැදීමෙන් පමණක් මෙවන් තත්වයකට පත්වේ. එවැනි අවස්ථාවකදී ඔහු මරණයට පත්වන්නේනම් ඔහු ස්වර්ගයට (පිවිසීමට) අවස්ථාව ලැබේ.

එසේ නොවන්නට (පාප කර්මයන්හි නියැළී), ලාඉලාහ ඉල්ලල්ලාහ් යන වචනය ආමන්ත්‍රණය කර, ඔහු වෙත අබමල් රේණුවක තරම් හෝ කුසල් කර්මයක් වේ නම්, හෙතෙම නිරයෙන් පිටමං කරනු ඇත. තවද අල්ලාහ් කෙනෙකුගේ සජ්දා අවයවයන් ද නිරයේ රළු ගිනිනට තහනම් කරනු ඇත. එම නිසා ලාඉලාහ ඉල්ලල්ලාහ් නම් වචනය ප්‍රකාෂ කළ කෙනෙකු පවා නිරයේ රළු ගිනිනට බිලි විය හැකි බව මේ මගින් ඔප්පු වේ.

ලාඉලාහ ඉල්ලල්ලාහ් මුහම්මදුර් රසූලුල්ලාහ් යන වචනය ප්‍රකාශ කළ අය හට නිරය තහනම් කර ඇත යනුවෙන් සඳහන් වන සමහර හදීස් පවා, හදීස් කලාවේ යම් යම් තද කොන්දේසි මත තීරණය කර ඇත. නිසැකයෙන්ම මෙම වචනය ප්‍රකාෂ කරනා බොහෝ අය එහි බැරෑරුම් තත්වය අවබෝධ නොකර තම සිත්සේ පිවත්වෙති. තවද මවුන්ගේ සිත්හී විශ්වාසයේ (ඊමාන්) හී ස්ථිරතාවයෙන් තොරව මෙම වචනය ප්‍රකාශ කරති.

මෙවන් අය මවුන්ගේ මරණාසන්න මොහොතේ දී එම ප්‍රකාශය කෙරෙහි පරීක්ෂණයට භාජනය වනු ඇත යනු වෙන් භිය විය යුතුය. මෙවැනි ඉරණමක් ගැන සිතා කෙ-නෙකු තීරණාත්මක අවධියකට එළඹෙන්නේ නම් හෙතෙම මෙම වචනය කෙරෙහි පැහැදෙනු ඇත.

කෙනෙකු පිරිසිදු සිතින් සහ ස්ථිරතාවයෙන් යුතුව මෙම වචනය ආමන්ත්‍රණය කර පාපකර්මයෙහි නොනියැලී ලොවෙහි වූ සියල්ලන් හට වඩා අල්ලාහ් වෙත මනාප වී තවද අල්ලාහ් වැළැක්වූ දෙයින් වැළැකී හා අල්ලාහ්ගේ

අණ පිළිපැදීම කෙරෙහි මහුගේ සිතෙහි කිසි අකැමැත්තක් නොවන්නේනම් මහු නිරයේ ගින්නෙන් ගැලවේ.

ලාඉලාහ ඉල්ලල්ලාහ්(වැඳීමට සුදුසු දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැත)යන වචනය ප්‍රකාෂ කරන්නා ස්වර්ග යට පිවිසෙයි යනුවෙන් මිනිසුන් කියනවා නොවෙද? යනුවෙන් හසන් (රලි) තුමාගෙන් ඇසූ කළ ලාඉලාහ ඉල්ලල්-ලාහ් යන වචනය ආමන්ත්‍රණය කර එහි සත්‍යතාවය පිළිගෙන වගකීම් ඉටු කරන්නේ කවරෙක්ද, ස්වර්ගයට පිවිසෙන්නේ මහුය, යනුවෙන් පිළිතුරු දුන්නේය.

ලාඉලාහ ඉල්ලල්ලාහ් යන වචනය ස්වර්ගයේ යතුරද? යනුවෙන් වහබ් බින් මුනබ්බිහ් තුමාගෙන් ඇසූ කළ, "මව් මිනැම යතුරකට දත් ඇත. දත් ඇති යතුරක් ගෙන එන්-නේනම් ස්වර්ගය මහු වෙනුවෙන් විවෘත වේ" යනුවෙන් පිළිතුරු දුන්නේය.

සියලුදේ දන්නේ අල්ලාහ් පමණී. සියළු ප්‍රශංසාවන් හිමි වන්නේ අල්ලාහ්ට පමණී. තවද අවසාන වක්තෘ වූ මුහම්මද් නබි (සල්) තුමා හට ශාන්තිය සමාදානය හා අල්ලාහ්ගේ කරුණාව සදා පවතීවා!